#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #November04

විවාහක කාන්තාවකගෙන් කප්පම් ගත් අයෙකු පිළිබඳ ප්‍රවෘත්තියක් දිවයින පුවත්පතේ පළ කොට තිබිණි. එහිදී එම ලිපියේ ස්වරය හා අන්තර්ගතය සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු විණි. මෙහිදී කරුණු තුනක් පිළිබඳව සැලකිල්ල යොමු කිරීම වටී.

මෙම සිදුවීමේ වින්දිතයා බවට පත්වූ කාන්තාව හඳුන්වා දීමට 'වෙසඟන' වැනි අපහාසාත්මක, ශිෂ්ටත්වයට නොහොබිනා වදන් පුවත්පත් ලිපියක පළවීම කෙතරම් සදාචාරාත්මක වන්නේද?

සිදුවීම සම්බන්ධයෙන් වින්දිතයා වරදකරු කරමින්, ඒක පාර්ශවික කථාන්තරයක් සමගින් මෙවැනි ලිපියක් පළ කිරීම කෙතරම් යෝග්‍ය වන්නේද?

සමස්තයක් ලෙසින් ලිපියේ ස්වරය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකිද?